# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# අභිලාෂ ප්‍රකාශ කිරීම සඳහා වන ආරාධනය (EOI)

**ඌන උපයෝජිත ඉඩම් / දේපළ ප්‍රශස්ත උපයෝජනය සඳහා සුදුසු ආයෝජකයින් වෙත ලබා දීම (සංශෝධිත) උක්ත කරුණ සම්බන්ධයෙන් අප විසින් ඉදිරිපත් කරන ලද 2025.08.31 දිනැති පුවත්පත් දැන්වීම හා බැඳේ.**

01. ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතනවලට අයත් ඌන උපයෝජිත ඉඩම්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ආයෝජකයන්ගෙන් අභිලාෂ ප්‍රකාශ කිරීම් (EOI) කැඳවනු ලැබේ. අදාළ ඉඩම් කොටස් සහ දේපළ පිළිබඳ විස්තර පහත 10 වන ඡේදයේ සඳහන් වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

02. සුදුසුකම් ලත් ආයෝජකයන් යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන සාමාන්‍ය පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ පවතින ලිඛිත නීතියක් යටතේ ස්ථාපිත නීතිමය පුද්ගලයෙකි.

03. අදාළ නිර්ණායක අනුව සුදුසුකම් සපුරාලන ආයෝජකයින් එක් එක් ඉඩම් කොටස සඳහා ලැයිස්තු ගත කරනු ලබන අතර, යෝජනා සඳහා වන ඉල්ලීම් (RFP) ලේඛන මිලදී ගැනීමට ඔවුන්ට ආරාධනා කරනු ලැබේ. එම අවස්ථාවේදී යෝජනා සඳහා වන ඉල්ලීම් (RFP) ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් ලැයිස්තුගත කළ ආයෝජකයින්ට නිකුත් කරනු ලැබේ.

04. උනන්දුවක් දක්වන ආයෝජකයෙකුට 10 වන ඡේදයේ සඳහන් වෙබ් අඩවියෙන් අභිලාෂ ප්‍රකාශ කිරීම් (EOI) ලේඛන බාගත කර ගත හැකිය.

05. අදාළ ඉඩම් / දේපළ නිරීක්ෂණය සඳහා අවසර දෙනු ලබන්නේ පූර්ව ලිඛිත අනුමැතියකින් පසුව පමණි. එවැනි අනුමැතියකින් තොරව පරිශ්‍රයට ඇතුළුවීමට අවසර දෙනු නොලැබේ.

06. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අභිලාෂ ප්‍රකාශ කිරීම (EOI) 2025 සැප්තැම්බර් 25 වැනි දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි අවශ්‍ය ඇමුණුම් සමගින් සභාපති, ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, 8 වන මහල, A පර්යන්තය, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නැතහොත් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ 8 වන මහලේ A පර්යන්තයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. යෝජනාව අඩංගු ලියුම් කවරය ඉහළ වම්පස කෙළවරේ "**EOI - ඌන උපයෝජිත ඉඩම් / දේපළ ප්‍රශස්ත උපයෝජනය සඳහා සුදුසු ආයෝජකයින් වෙත ලබා දීම**" Reference No (Annexure I හි පරිදි) ලෙස පැහැදිලිව සලකුණු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් විවෘත නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මේ සම්බන්ධයෙන් අමතර තොරතුරු, 8 වන මහල - D පර්යන්තය, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල යන ලිපිනයේ පිහිටි වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (වැවිලි කර්මාන්ත නවීකරණය හා විවිධාංගීකරණය) වෙතින්, දුරකථන අංක 011-2186223, ෆැක්ස් : 011-2186076, විද්‍යුත් තැපැල mpciunderutilizedland@gmail.com ඔස්සේ ලබා ගත හැකිය.

08. සියලුම අභිලාෂ ප්‍රකාශ කිරීම් (EOI) ලේඛන 2025 සැප්තැම්බර් 25 වැනි දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු අතර ප්‍රමාද වී ලැබෙන අභිලාෂ ප්‍රකාශ කිරීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත වේලාව අවසන් වූ පසු පහත දක්වා ඇති ලිපිනයේදී ආයෝජකයින්ගේ නියෝජිතයන් ඉදිරියේ එම අභිලාෂ ප්‍රකාශ කිරීම් විවෘත කරනු ලැබේ. (එක් අභිලාෂ ප්‍රකාශ කිරීමක් සඳහා එක් අයෙකුට සහභාගිවිය හැකිය)

09. සුදුසුකම් ලත් ආයෝජකයන්ට RFP අදියරයේදී ප්‍රති යෝජනා ඉදිරිපත් කිරීමට අවසර නොමැත.

10. මෙම EOI පිළිබඳ වැඩිදුර විස්තර, දේපළ ලැයිස්තුව සහ සුදුසුකම් නිර්ණායක ඇතුළුව අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ www.plantation.gov.lk හි "Procurement" ටැබය යටතේ සොයා ගත හැකිය.

**සභාපති, ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව,**
**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය,**
**8 වන මහල,**
**සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල.**